ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳ සහතික පත්‍ර වැඩ සටහන

පළමු සමාසික අවසාන පරීක්ෂණය 2007/2008

ළමා මනෝ විද්‍යාව- ESC 1222/1233

කාලය - පැය දෙකයි.

---

දිනය - 2008.03.15 වේලාව - ප.ව. 01.30- ප.ව. 04.30 දක්වා

---

ඕනෑම ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

01. පෙර පාසල් ගුරුවරියකට ළමා මනෝ විද්‍යාව හැදෑරීමෙන් ලැබිය හැකි ප්‍රයෝජන විස්තර කරන්න.

(ලකුණු 20)

02. i. ප්‍රත්‍යක්ෂ අධ්‍යයන හැර, ළමා අධ්‍යයන ශිල්පීය ක්‍රම දෙකක් (02) නම් කරන්න.

(ලකුණු 02)

ii. ඔබ නම් කළ එම ශිල්පීය ක්‍රම දෙක,පෙර පාසල් ළමුන් සඳහා භාවිතා කිරීමේදී ඔබට මුහුණදීමට සිදුවන ගැටළු පැහැදිලි කරන්න.

(ලකුණු 08)

iii. ප්‍රත්‍යක්ෂ අධ්‍යයන වාර්තාවක් පිළියෙල කිරීමේදී අන්තර්ගත වියයුතු ශීර්ෂ මොනවාදැයි කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 10)

03. i. `ප්‍රකට චර්යාව`,`සාමාන්‍ය චර්යාව` හා `සංවෘත චර්යාව` යන සංකල්ප කෙටියෙන් හඳුන්වන්න.

(ලකුණු 06)

ii. ළමුන් පන්ති කාමරය තුල දක්වන අවප්‍රමාණ චර්යා හතරක් (04) නම් කරන්න.

(ලකුණු 04)

iii. ඔබ විසින් සඳහන් කළ අවප්‍රමාණ චර්යාවන් අතරින් දෙකක් (02) තෝරාගෙන, එම චර්යාවන් දක්වන ළමයින්ට සහය විය හැක්කේ කෙසේදැයි විස්තර කරන්න.

(ලකුණු 10)

04. i. පුද්ගලයන් තුළ ඔබ දකින ආරය මගින් තිරණය වේ යයි සැලකිය හැකි ලක්ෂණ හයක් (06) නම් කරන්න.

(ලකුණු 06)

ii. මානව සංවර්ධනය කෙරෙහි ආරය හා පරිසරය දායක වන ආකාරය සාකච්ඡා කරන්න.

(ලකුණු 14)

05. i. පූර්ව ප්‍රසව අවධිය මනෝවිද්‍යාඥයින් විසින් මූලික අවධි කීපයකට බෙදා ඇත. එම අවධි නම් කරන්න.

(ලකුණු 03)

ii. පූර්ව ප්‍රසව අවධියේදී සංවර්ධනය කෙරෙහි බලපාන පරිසරාත්මක සාධක හතරක් (04) පැහැදිලි කරන්න.

(ලකුණු 10)

iii. නවජ සුතියාගේ මූලික අවශ්‍යතා විග්‍රහ කර, එම අවශ්‍යතා සපුරාලීම සඳහා දෙමාපියන් දැනුවත් කරන්නේ කෙසේදැයි විස්තර කරන්න.

(ලකුණු 07)

06. i. දරුවා සෙසු අය හා පවත්වන අන්තර් සම්බන්ධතාවන්ගේ ස්වභාවය පැහැදිලි කර, එය ඔහු/ඇයගේ පෞරුෂ සංවර්ධනය කෙරෙහි බලපාන අන්දම විස්තර කරන්න.

(ලකුණු 10)

ii. වයස අවුරුදු දෙකත් අටත් අතර වූ කාල වකවානුව තුළ දරුවෙකුගේ සමාජ හා පෞරුෂ සංවර්ධනය කෙරෙහි බලපාන සාධක නම් කර, ඉන් ඕනෑම දෙකක් (02) විස්තර කරන්න.

(ලකුණු 10)

07. i. සංවේදනය හා සංජානනය යන සංකල්ප අතර ඇති සම්බන්ධය පැහැදිලි කරන්න.

(ලකුණු 06)

ii. ප්‍රමාණය, වර්ණය හා වයනය සංජානනය කිරීම සඳහා පෙර පාසල් ළමයින්ට සහයවීමට, ඔබට සංවිධානය කළ හැකි ක්‍රියාකාරකම් (එක් සංකල්පයකට එක බැගින්)යෝජනා කරන්න.

(ලකුණු 14)

08. i. පියාජේ විසින් `බුද්ධිය` නිර්වචනය කර ඇත්තේ කෙසේදැයි සැකෙවින් දක්වන්න.

(ලකුණු 02)

ii. පියාජේ විසින් බුද්ධියේ ස්වභාවය හා ක්‍රියාවලිය විස්තර කිරීම සඳහා භාවිතා කරන ලද සංකල්ප නම් කර ඉන් තුනක් (03) විස්තර කරන්න.

(ලකුණු 18)

09. පහත දැක්වෙන ඕනෑම දෙකක් (02) සඳහා කෙටි සටහන් ලියන්න.

i. පියාජේගේ මතයට අනුව සදාචාර සංවර්ධන අවධි
ii. පෙර පාසල් වියේ ළමුන්ගේ චිත්තවේගීය රටා
iii. විශේෂ අවශ්‍යතා සහිත ළමුන් සිටින පන්ති සඳහා අන්තර්කරණ අධ්‍යාපනය.

(10 x 2 = ලකුණු 20)

\- හිමිකම් ඇවිරිණි. -